**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

# තේ පර්යේෂණ මණ්ඩලය

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# ඇබෑර්තු

1. **ක්ෂේත්‍ර නිලධාරී තනතුර, ශාන්ත ජෝකිම් වතුයාය, රත්නපුර**
2. **කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුර, ශාන්ත ජෝකිම් වතුයාය, රත්නපුර**
3. **රියදුරු තනතුර (ලොරි/ට්‍රැක්ටර්), ශාන්ත ජෝකිම් වතුයාය, රත්නපුර**

ශාන්ත ජෝකිම් වතුයායේ ඉහත තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ක්ෂේත්‍ර නිලධාරී තනතුර

**රැකියා විස්තරය:**

වතු අධිකාරීවරයාගේ උපදෙස් පරිදි අස්වැන්න නෙළීම, කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම, සියලුම අංශයන්හි පොත්පත් නඩත්තු කිරීම සහ සේවක ගැටලු විසඳීම ඇතුළු සියලු කටයුතු සඳහා වගකීම දැරීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද:**

ඉංග්‍රීසි සහ අංක ගණිතය/ගණිතය විෂයයන් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම (මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අය සඳහා මෙය අදාළ නොවේ).

**සහ**

සහකාර ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

**වැටුප** : මසකට රු. 40,190/- - 1,775 X 40 - රු. 111,190/-

**වයස් සීමාව** : වයස අවුරුදු 32 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. තේ පර්යේෂණ ආයතනයට අයත් වතුයායන්හි දැනට සේවයේ නියුතු අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 2. කනිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුර

**රැකියා විස්තරය**

කර්මාන්තශාලා නිලධාරියාගේ අධීක්ෂණය යටතේ තේ සැකසීම සහ ඊට අදාළ කටයුතුවලදී කර්මාන්තශාලා නිලධාරියාට සහාය වීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

ඉංග්‍රීසි සහ අංක ගණිතය/ගණිතය සහිත අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම. (ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අය සඳහා මෙය අදාළ නොවේ).

**සහ**

පුහුණුවලත් කර්මාන්තශාලා පරීක්ෂකවරයෙකු වීම.

**වැටුප** : මසකට රු. 38,965/- - 875 X 40 - රු. 73,965/-

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. තේ පර්යේෂණ ආයතන (TRI) වතුයායන්හි දැනට සේවයේ නියුතු අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 3. රියදුරු තනතුර (ලොරි / ට්‍රැක්ටර්)

**රැකියා විස්තරය :**

වතු අධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ අදාළ වාහන භාරව කටයුතු කිරීම සහ අමු දළු, වෙනත් ද්‍රව්‍ය මෙන්ම රෝගීන් ප්‍රවාහනය කිරීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද :** 08 ශ්‍රේණිය සමත් වී තිබීම.

**සහ**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද (බර වාහන පැදවීම සඳහා වන) වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක රිය පැදවීමේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් තිබීම.

**වැටුප** : මසකට රු. 37,690/- - 875 X 40 - රු. 72,690/-

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. තේ පර්යේෂණ ආයතනයට අයත් වතුයායන්හි දැනට සේවයේ නියුතු අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

මෙම තනතුරු ස්ථිර වේ. තේරී පත්වන අයදුම්කරුවන්ට සේවා අවශ්‍යතා අනුව රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මගින් පාලනය වන වෙනත් ඕනෑම වතුයායක සේවය කිරීමට සිදු වේ.

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු, උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික සහ වෙනත් වෘත්තීය සුදුසුකම්, සේවා සහතිකවල පිටපත් සහ අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා සහ දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපින ඇතුළත් අයදුම්පතක් පිළියෙල කළ යුතුය.

කවරයේ ඉහළ වම් පස කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර, **2026 ඔක්තෝබර් 05** වන දිනට හෝ ඊට පෙර පහත අත්සන් කර ඇති අය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කුම්බිස්, තලවාකැලේ.**

Gazette.lk
SINCE 2014
AMBITIONS REALIZED